# සුපිරිසිදු දෑත්

## චර්යා පද්ධතිය

## "දූෂණයට එරෙහි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ සන්ධානය"


28/10, මලලසේකර මාවත,
කොළඹ-07,
ශ්‍රී ලංකාව.
☎: ##94-11-**2508849**

# සුපිරිසිදු දැත්

## දූෂණයට එරෙහි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ සන්ධානය සාමාජිකයින් සඳහා චර්යා පද්ධතිය

01. **පොදු කරුණු**

(අ) සුපිරිසිදු දැත් සන්ධානයේ සාමාජිකයින් සෑම විටම,

(i) රාජ්‍ය සේවයේ කීර්තිය, ගෞරවය සහ මහජනයා තුළ රාජ්‍ය සේවය කෙරෙහි ඇති විශ්වාසනීයත්වය රඳා පවතින්නේ රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ඒකාග්‍රතාවය මත බව පිළිගනු ඇත.

(ii) රාජ්‍ය සේවයේ කීර්තිය සහ ගෞරවය පැවැත්වෙන පරිදි සහ එය තවත් වර්ධනය වන පරිදි කටයුතු කරණු ඇත.

(iii) රාජ්‍ය සේවයේ උසස්ම සම්ප්‍රදායන් පවත්වා ගෙන යනු ඇත.

(iv) තමන් මහජනතාවගේ සේවකයන් බව ද තමන් නඩත්තු කරනු ලබන්නේ මහජනතාව විසින් බව ද, තමන් රාජ්‍ය අංශයේ තනතුරු දරනු ලබන්නේ මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා බව ද නිතරම අවධානයේ තබා ගනු ඇත.

(ආ) **සන්ධානයේ සාමාජිකයින්**

(i) තම කාර්යාලයේ රාජකාරී කටයුතු මනා කුසලතාවයකින් ද, ප්‍රවේසම් සහිතවද, දැඩි අවධානයකින් යුක්තවද අපක්ෂපාතී භාවයෙන් ද ඉටු කරනු ඇත.

(ii) තම රාජකාරී ඉටු කිරීමෙහිදී සියළුම නීති හා රෙගුලාසි වලට ද තම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නීති වලටද අනුකූලව කටයුතු කරනු ඇත.

(iii) නීත්‍යානුකූලව සහ හේතු සහිතව ලබා දෙන නියෝගයන්ට අනුකූල වනු ඇත.

(iv) තමන්ගෙන් සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණෙන මහජනතාවට කාරුණිකව සහ ආචාරශීලීව සැලකීමටත් ඔවුන්ගේ අයිතීන්ට ගරු කිරීමටත් ඉහළම කාර්යක්ෂමතාවයෙන් සහ ගෞරවනීය ලෙස ඔවුන්ට සේවය කිරීමටත් බැඳී සිටිනු ඇත.

(v) රජයේ සම්පත් භාවිතයේදී අනවශ්‍ය වියදම්, නාස්තිය සහ ස්වයං වරප්‍රසාද මග හැරෙන ලෙස කටයුතු කරනු ඇත.

(vi) තමාට වෙන් කර දී ඇති රජයේ දේපල, ස්ථාන හෝ ගොඩනැගිලි අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙනත් අයගේ පරිහරණයට හෝ කුලියට ලබා දීමට කටයුතු නොකරනු ඇත.

(vii) කිසියම් දීමනාවක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ලබා ගැනීමේ චේතනාවෙන් කිසිවකුට විශේෂ සැලකිලි දැක්වීමෙන් හෝ වෙනත් රාජ්‍ය අංශයේ නිලධාරියෙකුට එවැනි සැලකිලි දැක්වීම සඳහා බලකිරීමෙන් තවත් පාර්ශවයකට අවාසි වන ලෙස කටයුතු නොකරනු ඇත.

(viii) රාජ්‍ය සේවයේ හෝ තම කාර්යාලයේ රාජකාරි කටයුතු කෙරෙහි බැඳීමක් ඇති වන ආකාරයේ කිසිම ආකාරයක පොරොන්දු සහ ප්‍රතිඥා ලබා නොදෙනු ඇත.

(ix) තම රාජකාරි ඉටු කිරීමේදී තමා වෙත ලැබෙන තොරතුරු හෝ තමාට ලබා ගත හැකි තොරතුරු තමාට හෝ තම පවුලේ සාමාජිකයෙකුට හෝ තම හිතවතෙකුට හෝ ඇසුරු කරන වෙනත් අයෙකුට වරප්‍රසාද ලබා ගැනීමට පාවිච්චි නොකරනු ඇත.

(x) තම දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ / ආයතනයේ ප්‍රධානියාගේ අවසරයක් නොමැතිව තමාට ලැබෙන තොරතුරු හෝ තම භාරයේ ඇති ලියකියවිලි වල අඩංගු තොරතුරු රාජකාරි අවශ්‍යතාවයකට හැර කිසිම හේතුවක් මත වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට ලබා නොදෙනු ඇත.

(xi) දූෂණයට සම්බන්ධ කටයුතු සම්බන්ධයෙන් තමාට ලැබෙන සෑම තොරතුරක්ම "සුපිරිසිදු දැත් " සන්ධානයේ විධායක කමිටුව වෙත ලබා දෙනු ඇත.

(xii) නීති විරෝධි හෝ අක්‍රමවත් ලෙස කිසිම රාජ්‍ය වත්කමක හිමිකම මාරු කිරීමට හෝ අනිසි ලෙස පාවිච්චි කිරීමට කටයුතු නොකරනු ඇත.

(xiii) ඉහළ නිලධාරියෙකුගේ හෝ වෙනත් බලවත් පුද්ගලයෙකුගේ බලපෑම මත හෝ ඉල්ලීම මත අක්‍රමවත් හෝ දූෂණ කටයුතු වලට කිසිම ආකාරයකින් සම්බන්ධිත පාර්ශවයක් නොවෙනු ඇත.

(xiv) රාජ්‍ය අංශයේ නිලධාරියෙකු ලෙස හෝ සුපිරිසිදු දැත් සන්ධානයේ සාමාජිකයෙකු ලෙස තමා වෙත තබා ඇති විශ්වාසය පළුදු වන ආකාරයේ කිසිම කටයුත්තකට සම්බන්ධ වීමට හෝ හැසිරීමට කටයුතු නොකරනු ඇත.

(ඇ) රජයට කිසිම ආකාරයකින් සම්බන්ධ මූල්‍ය ගනුදෙනුවකට හෝ යෝජිත ගිවිස ගැනීමකට සම්බන්ධ කිසිම පුද්ගලයෙකුගෙන් කිසියම් දීමනාවක් හෝ වෙනත් වරප්‍රසාදයක් තමාට, තම පවුලේ සාමාජියෙකුට, හිතවතෙකුට හෝ සමීපතමයෙකුට ලබා ගැනීමට කටයුතු නොකරනු ඇත.

(ඈ) කිසිම සාමාජිකයෙක් තමාට, තම පවුලේ සාමාජිකයෙකුට, තම හිතවතෙකුට හෝ සමීපතමයෙකුට වරප්‍රසාදයන් ලැබෙන පරිදි තම නිල තනතුර පාවිච්චි නොකරනු ඇත. මෙවැනි වරප්‍රසාද අතරට ත්‍යාග, නොමිලේ ලැබෙන පහසුකම් ප්‍රවාහන, ආගන්තුක සත්කාර, සංග්‍රහ අයත් වෙයි.

(ඉ) නීතියෙන් තමාට හිමි හෝ අනුමත දීමනාවලට අමතරව කිසිම ආකාරයක දීමනාවක් හෝ ත්‍යාගයක් මුදල්වලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් කිසිම සාමාජිකයෙකු විසින් පිළිගනු නොලබනු ඇත.

(ඊ) තම රාජකාරි කටයුතු ඉටු කිරීමේදී තමාගේ තම පවුලේ සාමාජිකයෙකුගේ, තම හිතවතෙකුගේ, තම සමීපතමයෙකුගේ මූල්‍ය වුවමනාවන්, අවශ්‍යතාවයන් සමග කිසිම ආකාරයක ගැටීමක් ඇති නොවීමට වගබලා ගනු ඇත. එවැනි ගැටුමක් ඇති වේයැයි තමාට පෙනී යන්නේ නම් තම ආයතන ප්‍රධානියා වෙත ඒ පිළිබඳ දැනුම් දී ඒ අනුව ලැබෙන උපදෙස් මත එවැනි ගැටීමක් මගහැරෙන ලෙස කටයුතු කරනු ඇත.

02. ආගන්තුක සත්කාර

(අ) නිල කටයුත්තක් වන විට හැර අන් කිසිම අවස්ථාවකදී කිසිම සාමාජිකයෙකු රජය සමග කොන්ත්‍රාත් ගිවිසුම් හෝ මූල්‍ය ගනුදෙනු වලට සම්බන්ධ වී ඇති පුද්ගලයින්ගෙන් හෝ විදේශීය දූත කණ්ඩායම් වලින් හෝ අන්තර්ජාතික සංවිධානවලින් භෝජන සංග්‍රහ, පිළිගැනීමේ උත්සව හෝ වෙනත් ආකාරයක ආගන්තුක සත්කාර සඳහා ලැබෙන ආරාධනා පිළිගනු නොලබනු ඇත. තම පෞද්ගලික සම්බන්ධතා මත එවැනි ආගන්තුක සත්කාර සඳහා ලැබෙන ආරාධනා පිළිගන්නා විටෙක දැඩි අවධානයකින් සහ සැලකිල්ලකින් යුක්තව කටයුතු කිරීමට වගබලා ගනු ලැබේ. එලෙස පිළිගනු ලබන ආරාධනාවන් සම්බන්ධව තම ආයතන ප්‍රධානියා දැනුවත් කර තිබිය යුතුය.

(ආ) නිල උත්සව වලදී සාමාජිකයින්ගේ හැසිරීම ඉහළම සම්ප්‍රදායන්ට අනුකූලව ගෞරවනීය ලෙස සිදු විය යුතුය.

(ඇ) දිවා භෝජන, රාත්‍රී භෝජන සහ වෙනත් සංග්‍රහයන් සඳහා ලැබෙන ආරාධනා පිළිගැනීමේදී එමගින් තමාට හිමි තත්ත්වය හීන නොවන බවටත් එමගින් තමාගෙන් කිසියම් ආකාරයක අනිසි සැලකිලි ලබා ගැනීමට උත්සාහයක් නොමැති බවටත් සාමාජිකයෙකු විසින් සහතික විය යුතුය. එවැනි තත්ත්වයක් ඇති වේ යැයි හැගෙන සෑම විටම එවැනි අවස්ථාවන් මගහැරීමට කටයුතු කළ යුතුය.

(ඈ) රේස්, සූදු වැනි කටයුතු සිදු වන සමාජ ශාලා , කැසිනෝ වැනි ආයතනවලට යෑමෙන් සාමාජිකයින් වැළකිය යුතුය.

03. විදේශීය චාරිකා

(අ) විදේශයකින් ශ්‍රී ලංකාව තුලට පැමිණෙන අවස්ථාවකදී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත චාරිකාවන්ට සහභාගී වන අවස්ථාවලදී රේගු සහ වෙනත් ආයතනවලින් පනවා ඇති ගාස්තු, ගෙවීම්, බදු මුදල් හා නීතිරීති වලින් නිදහස් වීමට තම රාජකාරී බලය යොදා නොගත යුතුය.

(ආ) රජයේ පිළිගත් නීතිරීතිවලට අනුකූලව අදාළ බලධාරීන්ගේ අනුමැතියකින් තොරව විදේශීය රජයකින් හෝ ජාත්‍යන්තර සංවිධානයකින් හෝ ආයතනයකින් වියදම් දරා විදේශීය චාරිකාවන් සඳහා තමන්ට කරණු ලබන ආරාධනා සාමාජිකයින් විසින් භාර නොගත යුතුය.

04. විදේශීය රටවලදී හැසිරිය යුතු ආකාරය

(අ) විදේශීය රටවලදී සාමාජිකයෙකු තම රටේ , තම ආණ්ඩුවේ, රාජ්‍ය සේවයේ හෝ සුපිරිසිදු දැන් සංවිධානයේ කීර්තිනාමයට හානි සිදු නොවන ආකාරයට හැසිරීමට වගබලා ගත යුතුය.

(ආ) විදේශීය රටවලදී තමා වෙතින් අපේක්ෂා කරන කීර්තිය, තත්ත්වය සහ විශ්වාසනීයත්වය කඩ නොවන පරිදි හැසිරීමට සාමාජිකයින් වගබලා ගත යුතුය.

## 05. චර්යා පද්ධතිය කඩ කිරීම

චර්යා පද්ධතිය කඩ වන ආකාරයෙන් කිසියම් සාමාජිකයෙකු කටයුතු කර ඇතැයි වාර්තා වුවහොත් ඒ ගැන විධායක කමිටුව විසින් ගත යුතු විනය පියවර ගැන තීරණය කරනු ඇත. එවැනි අවස්ථාවක විනය බලධාරින් විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයකට අමතරව, සාමාජිකයාගේ සාමාජිකත්වය සම්බන්ධව ඕනෑම තීරණයක් ගැනීමේ අයිතිය විධායක කමිටුව සතු වේ.

## 06. චර්යා පද්ධතිය ආදේශ කිරීම.

රජය විසින් ඉදිරියේදී රාජ්‍ය අංශයේ නිලධාරින් සඳහා කිසියම් චර්යා පද්ධතියක් සම්මත කරනු ලැබුවහොත් දැනට සන්ධානය විසින් අනුමත චර්යා පද්ධතිය වෙනුවට එලෙස සම්මත කරනු ලබන චර්යා පද්ධතිය ආදේශ කරනු ලැබේ. කෙසේ වුවද මහජනතාවගේ අවශ්‍යතාවයන්ට අනුව සන්ධානයේ සාමාජිකයින්ගෙන් වැඩි ක්‍රියාකලාපයක් අපේක්ෂා කරන්නේ නම් දැනට පවත්නා චර්යා පද්ධතියේ ඕනෑම කොටසක් තවදුරටත් තබා ගැනීමට විධායක කමිටුවට තීරණය කළ හැකිය.